# සංවාද පිටපත

## 1　おはようございます

**[01-1]**

සුබ උදෑසනක්.

**[01-2]**

ආයුබෝවන්.

**[01-3]**

සුබ සන්ධ්‍යාවක්.

**[01-4]**

සුබ රාත්‍රියක්.

**[01-5]**

කෘතඥපූර්වකව අනුභව කරමි. (කෑම ආරම්භ කිරීමට පෙර කියන ප්‍රකාශය)

**[01-6]**

කෑමට බොහොම ස්තුතියි. (කෑම අනුභවයෙන් පසු කියන ප්‍රකාශය)

## 2　いってらっしゃい

**[02-1]**

සත්කාරක පවුල: හොඳින් ගිහින් එන්න.

ඔබ: ගිහින් එන්නම්.

**[02-2]**

සත්කාරක පවුල: ආපහු ආවාද, පිළිගන්නවා.

ඔබ: මම ආවා.

**[02-3]**

සමාගමේ කෙනා: ඔබට පෙර කල්තියා මම පිටත් වනවා

ඔබ: අදත් මහන්සි වීම ගැන ස්තූතියි.

**[02-4]**

මිතුරා: එන්න

ඔබ: ඔව් මට එන්න අවසර.

## 3　遅くなってごめん

**[03-1]**

මිතුරා: මෙන්න, මගෙන් තෑග්ගක්.

ඔබ:හෝ, ස්තුතියි.

**[03-2]**

වයසක කාන්තාව: ඒක ලොකු උපකාරයක් වුනා. බොහොමත් ස්තුතියි.

ඔබ: අනේ නැහැ, ඒ ගැන කරදර වෙන්න එපා.

**[03-3]**

පිරිමි කෙනා: ආච්!

ඔබ: සමාවෙන්න.

**[3-4]**

මිතුරා: පරක්කු වුණාට සමාවෙන්න!

ඔබ: නැහැ, කමක් නැහැ.

## 4　いい天気ですね

**[04-1]**

අසල්වැසියා: සුබ උදෑසනක්. මේ දවස්වල නම් සීතලයි නේ.

ඔබ: ඔව්, එහෙමයි.

**[04-2]**

අසල්වැසියා: ආ, ආයුබෝවන්. අද හොඳදවසක් වගේ නේ.

ඔබ: ඔව්, ඒක නම් එහෙම වාගේ නේ.

**[04-3]**

අසල්වැසියා: මේ දවස්වල, හරිම රස්නෙයි නේ.

ඔබ: ඔව්, ඇත්තටම.

**[04-4]**

අසල්වැසියා: ආ, ආයුබෝවන්. අද නම් හුළඟ තදයි වගේ නේ.

ඔබ: ඔව්, ඒක නම් එහෙම වාගේ නේ.

**[04-5]**

අසල්වැසියා: අයියෝ, අද නම් වැස්ස හොඳටම තදයි වාගේ නේ.

ඔබ: ඔව්, ඇත්තටම.

**[04-6]**

අසල්වැසියා: මේ දවස්වල, ටිකක් සිසිල් වෙලා නේද?

ඔබ: ඔව්, ඉතින් සරත් ඍතුව ඇවිත් නේ.

## 5　読んでください

**[05-1]**

ගුරුවරයා: ඔව් අහන්න.

**[05-2]**

ගුරුවරයා: ඔව් බලන්න.

**[05-3]**

ගුරුවරයා: ඔව් කියවන්න.

**[05-4]**

ගුරුවරයා: ඔව් ලියන්න.

**[05-5]**

ගුරුවරයා: ඔව් කියන්න.

**[05-6]**

ගුරුවරයා: ඔව් දෙදෙනා එක්ව කතා කරන්න.

## 6　ベトナムから来ました

**[06-1]**

ලින්: හැමෝටම ආයුබෝවන්, සියළුම දෙනා දැක හමු වීම සතුටක්. මම ලින්.

මම වියට්නාමයෙන්. ඔබ සැමගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා.

**[06-2]**

ජොන්: මම කිම් ජොන්හෝ. මට “ජොන්” කියලා අමතන්න.

මම කොරියාවෙන්. ගිය අවුරුද්දේ තමයිතමයි ජපානයට ආවේ. ඔබ සැමගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා.

**[06-3]**

තාපා: සියළුම දෙනා දැක හමු වීම සතුටක්. මගේ නම තාපා.

මම නේපාලයෙන්. ඔබ සැමගේ සහයෝගය කාරුණිකව බලාපොරොත්තු වෙනවා.

**[06-4]**

ඇලිස්: සියළුම දෙනා දැක හමු වීම සතුටක්. මම ඇලිස්.

මගේ තාත්තාත් අම්මාත් ඉන්දියාවෙන්, නමුත් මම උපන්නේ ඕස්ට්‍රේලියාවේ.

## 7　店長をしています

**[07-1]**

ඔබ: ලින්, සන්, ඔබේ රැකියාව?

ලින්: මම අවන්හලක සේවයකරනවා. දැන් අවුරුදු 15ක් විතර. දැන් මම කළමනාකරුවෙක්.

**[07-2]**

ඔබ: ඇලිස් සන්, ඔබ කරන රැකියාව මොන වගේද?

ඇලිස්: මම, අම්... ප්‍රාථමික පාසලක ඉංග්‍රීසි උගන්වනවා.

**[07-3]**

ඔබ: ජොන් සන් ඔබ?

ජොන්: මම තවම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. ඉංජිනේරු පීඨයේ තුන්වන වසරේ.

**[07-4]**

ඔබ: තාපා සන්, ඔබ කරන රැකියාව මොකක්ද?

තාපා: මම මෝටර් රථ ඉංජිනේරුවෙක් විදිහට වැඩ කරනවා.

## 8　おいくつですか

**[08-1]**

ඔබ: මොනතරම් හුරතල් දරුවෙක් නේ. වයස කීයද?

අසල්වැසියා: අවුරුදු 5යි.

**[08-2]**

සමාගමේ කෙනා: අද අපේ සුරතල් පූසාගේ උපන්දිනය.

ඔබ: වාව්, සුබ පැතුම්. වයස කීයද?

සමාගමේ කෙනා: අවුරුදු 3යි.

**[08-3]**

ඔබ: ඔබේ පුතා, දැන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්ද?

සමාගමේ කෙනා: නැහැ, දැන් රැකියාවක් කරනවා. වයස 27යි.

**[08-4]**

ඔබ: ඔබේ දියණියට දැන් වයස කීයද?

සමාගමේ කෙනා: මේ අවුරුද්දේ වයස 20 (විසිවස්) ලැබුවා.

**[08-5]**

ඔබ: ඔබේ පියා,සනීපෙන්ද?

සමාගමේ කෙනා: ඔව්, සනීපෙන්. මේ අවුරුද්දේ වයස 60යි.

## 9　誕生日はいつですか

**[09-1]**

ඔබ: ෂෝතා සන්, ඔබේ උපන්දිනය කවදාද?

ෂෝතා: දෙසැම්බර් 2 වෙනිදා.

**[09-2]**

ඔබ: ගුරුතුමා/ගුරුතුමිය, පරීක්ෂණය කවදාද?

ගුරුවරයා: පෙබරවාරි 1 වෙනිදා.

**[09-3]**

ගුරුවරයා: හැමෝම, ගෙදර වැඩ අප්‍රේල් 9 වෙනිදාට පෙර ඉවර කරන්න ඕනේ.

**[09-4]**

ඔබ: තාන් සන්, ගිම්හාන නිවාඩුව ළඟයිනේ ඔබ රටට ආපහු යන්නේ කවදාද?

තාන්: ජූලි 24 වෙනිදා ආපහු යනවා.

**[09-5]**

ඔබ: තකහාෂි සන්, ව්‍යාපාරික චාරිකාව පටන් ගන්නේ කවදාද?

තකහාෂි: සැප්තැම්බර් 20 වෙනිදා සිට.

## 10　妹のあかりです

**[10-1]**

උඑදා: මේ මගේ තාත්තා.

**[10-2]**

උඑදා: මේ මගේ අම්මා.

**[10-3]**

ඔබ: මේ කෙනා…

උඑදා: මගේ අයියා. මට වඩා අවුරුදු දෙකක් වැඩිමල්.

**[10-4]**

ඔබ: මේ කෙනා…

උඑදා: මගේ නංගි අකාරි.

## 11　いくらですか

**[11-1]**

ඔබ: මේ තොප්පිය, හරිම ලස්සනයි! කීයද?

විකුණුම්කරු: යෙන් 4,000යි.

ඔබ: එහෙමද. ආ, අර බෑග් එක?

විකුණුම්කරු: යෙන් 6,800යි.

ඔබ: එහෙමද.

**[11-2]**

ඔබ: මේ ටී-ෂර්ට් එකත් හොඳයි නේද. ...කීයද?

විකුණුම්කරු: ඒක ඇත්තටම යෙන් 1,000යි, ඒත්...

සියයට 50 අඩු කරලා යෙන් 500කට දෙන්නම්.

ඔබ: ඒ, ඇත්තටමද! එහෙනම්, මේක, දෙන්න.

## 12　ばんそうこうはどこですか

**[12-1]**

ඔබ: අම්... සමාවෙන්න.

විකුණුම් සේවිකාව A: ඔව්, සාදරයෙන් පිළිගන්නවා.

ඔබ: අම්...වේ,වෙළුම් පටි...? තියෙනවද?

විකුණුම් සේවිකාව A: ආ, “වෙළුම්පටි” නේද.

වෙළුම් පටි නම්, පහළ මාලයේ 1 වන තට්ටුවේ ඖෂධසැලේ තියෙනවා.

ඔබ: තේරුණා. බොහොම ස්තුතියි.

**[12-2]**

ඔබ: සමාවෙන්න. වෙළුම් පටි ඇත්තේ කොහෙද?

විකුණුම් සේවකB: වෙළුම් පටි නේද. ඒවා... අර පැත්තේ. පිවිසුම ළඟ.

ඔබ: ආ, තේරුණා. බොහොම ස්තුතියි.

## 13　お弁当は温めますか

**[13-1]**

ඔබ: ලබා දෙන්න.

විකුණුම්කරු: මුදල් භාර ගන්නම්. ප්ලාස්ටික් බෑග් එකක් අවශ්‍යද?

ඔබ: නැහැ, මගේම බෑග් එක තියෙන නිසා අවශ්‍ය නැහැ.

විකුණුම්කරු: අපි මෙතනින් බෑග් එකට දාන්නද?

ඔබ: මමම දාගන්නම්. ස්තුතියි.

විකුණුම්කරු: දිවා ආහාර පැකට්ටුව රත් කරන්නද?

ඔබ: ආ, එහෙම කරන්න.

**[13-2]**

විකුණුම්කරු: මේ සඳහා වයස තහවුරු කිරීම අවශ්‍යයි. කරදරයක් නොවේ නම් හැඳුනුම්පතක් පෙන්වන්න පුළුවන්ද?

ඔබ: ආ, නේවාසික පදිංචි කාඩ්පත හරිද?

විකුණුම්කරු: ඔව්. ...තහවුරු කරනු ලැබුවා. ස්තුතියි.

මුළු ගාස්තුව යෙන් 1,580යි.

ඔබ: ප්‍රවාහන IC කාඩ්පතෙන් ගෙවන්නම්.

විකුණුම්කරු: එහෙනම් මෙතැනට ටච් කරන්න.

## 14　ポイントアプリはお持ちですか

**[14-1]**

විකුණුම්කරු: පාරිභෝගික, ඔබට ළකුණු රැස් කිරීමේ යෙදුමතියෙනවද?

ඔබ: නැහැ, මට නැහැ.

විකුණුම්කරු: යෙදුම භාවිත කළොත්, යෙන් 100කට ළකුණු 1ක් එකතු වෙනවා.

ඔබ: ආහ්, එහෙමද.

විකුණුම්කරු: එකතු වූ ළකුණු, ඊළඟ මිලදී ගැනීමේ සිට ළකුණකට1ක් යෙන් 1ක් ලෙස භාවිත කරන්න පුළුවන්.

ඔබ: එහෙමද.

**[14-2]**

විකුණුම්කරු: භාවිත කිරීමට, යෙදුම බාගත කළ පසු ඊමේල් ලිපිනය සහ නම ලියාපදිංචි.කිරීම අවශ්‍ය වෙනවා.

ඔබ: එහෙමද. ඒත්, අර, අද වෙලාව නැති නිසා කමක් නැහැ.

## 15　あちらの試着室へどうぞ

**[15-1]**

විකුණුම්කරු: පාරිභෝගික ඔබට උදව් කරන්නද?

ඔබ: අම්... මට මේක හැඳ පැළඳ තහවුරු කර බලන්න පුළුවන්ද?

**[15-2]**

විකුණුම්කරු: ඔව්, වඩාත් තේරුණා. භාණ්ඩ,කීයක්ද?

ඔබ: දෙකයි.

විකුණුම්කරු: එහෙනම් අර හැඳ පැළඳ තහවුරු කරන කාමරයට යන්න. මේ ෆේස් කවර් එක භාවිත කරන්න.

දැන් අන්තිම කාමරය හිස්. සපත්තු ගලවලා ඇතුළට යන්න.

ඔබ: මට තේරුණා.

## 16　美容院に行いきます

**[16-1]**

ඔබ: ආ, රිසා, සන්, අදත් වෙහෙස මහන්සි වුණා නේ.

අම්... හෙට සෙනසුරාදා, පුස්තකාලයේ එකට ගෙදර වැඩ කරමුද?

රිසා: හෙට? හොඳයි. ටිකක් යොදා ගත් වැඩ නම් තියෙනවා, ඒත්...

ඔබ: එහෙමද. මොනවද කරන්නෙ?

රිසා: උදේ රූපලාවන්‍යාගාරය වෙත යනවා. 10ට වෙන් කරලා තියෙන්නේ.

දවල්, යාළුවෙක් එක්ක කෑම කාලා, ඊට පස්සේ සාප්පු යනවා.

**[16-2]**

ඔබ: ආහ්, එහෙනම් කාර්ය බහුලයි නේද.

රිසා: ආ, ඒත් සාප්පු ගිහින් ඉවරවුණාට පස්සේ 4 ඉඳන් මට වෙලාව තියෙනවා.

ඔබ: ඒත්, ඔයා කාර්ය බහුල නේද?

රිසා: නැහැ නැහැ, කමක් නැහැ, මටත් එකට ගෙදර වැඩ කරන්න ඕනේ.

පැය දෙකක් විතර පාඩම් කරමු.

## 17　土曜日にバイトがあります

**[17-1]**

රාන්: හෙලෝ.

ඔබ: හෙලෝ. රාන් සන්, දැන් කතා කරන්න පුළුවන්ද?

රාන්: පුළුවන්. මොකද?

ඔබ: කලින් කැරඔකේ යන්න ඕනේ කියලා කතා කළා නේද.

රාන්: ආ, මතකයි.

ඔබ: ලබන සතිය කොහොමද?

රාන්: ලබන සතිය? හොඳයි. නේ.

ලබන සතියේ සඳුදා, බදාදා සහ සෙනසුරාදා මට අර්ධකාලීන වැඩ තියෙනවා.

අඟහරුවාදාත් බ්‍රහස්පතින්දාත් වෙන වැඩ තියෙනවා... ඉරිදා නම්... නිදහස්.

ආ, තව සිකුරාදාත් පුළුවන්.

**[17-2]**

ඔබ: හරි. තේරුණා.

ආ, රාන්, අර කැරඔකේ තැන, ලාභ කවදාද?

රාන්: අම්... සඳුදා සහ බ්‍රහස්පතින්දා ටිකක් ලාභයි.

සති අන්තය සතියේ දිනවලට වඩා මිල වැඩියි.

ඔබ: තේරුණා. එහෙනම් සිකුරාදා යමු.

## 18　明日の待ち合わせなんだけど…

**[18-1]**

රාන්: හෙලෝ. මම රාන්.

ඔබ: හෙලෝ. රාන්, සන් දැන් කතා කරන්න පුළුවන්ද?

රාන්: පුළුවන්.

ඔබ: හෙට කැරඔකේ යන්න හමුවෙන එක ගැන... කොහොම කරමුද?

**[18-2]**

රාන්: බලමු...

දුම්රිය ස්ථානයේදී එකතුවෙලා, ඊට පස්සේ එකට එතැනට යමු.

අම්... කැරඔකේ 11ට පටන් ගන්න නිසා, මිනිත්තු 15කට කලින් යමකවා දුම්රිය ස්ථානයේදී හමුවෙමුද?

ඔබ: ඔව්, එහෙම කරමු.

## 19　遅くなりそう

**[19-1]**

ඔබ: හෙලෝ.

තනාකා: හෙලෝ, අනිතා සන්?

ඔබ: ඔව්. තනාකා සන්, මොකද වුණේ?

තනාකා: සමාවෙන්න! දැන්මයි අවදි වුණේ!

ඉක්මනට ලෑස්ති වෙනවා, ඒත් සැයොදා ගත් වේලාවට වඩා මිනිත්තු 15ක් විතර පරක්කු වෙයි. ඇත්තටම සමාවෙන්න!

ඔබ: ඇත්තටම? තේරුණා. මමත් තවම ගෙදර නිසා කමක් නැහැ.

**[19-2]**

ඔබ: හෙලෝ.

තනාකා: අනිතා සන්, ඇත්තටම සමාවෙන්න.

ඔබ: ආ, හරි. මොකද වුණේ?

තනාකා: දැන්දුම්රිය ස්ථානයේදී නමුත්, කාලසටහන අවුල් වෙලා වගේ, තවත් පරක්කු වෙයි.

ඔබ: ආ, ඒක අසීරුයි නේ.

තනාකා: දැන් 10:05යි නිසා... තව මිනිත්තු 20කින් විතර එන්න පුළුවන් වෙයි. ඇත්තටම සමාවෙන්න!

ඔබ: තේරුණා. පරිස්සමෙන් එන්න.

## 20　休みはどこか行くんですか

**[20-1]**

ඔබ: අදත් ඇත්තටම සීතලයි නේ...

යමමොතෝ සන්, අලුත් අවුරුදු නිවාඩුවේ කොහෙහරි යන්න යොදා ගැනීමක් තියෙනවද?

යමමොතෝ: අලුත් අවුරුදු නිවාඩුවද? අම්... හොක්කයිඩෝ යන්න හිතාගෙන ඉන්නවා.

හිම පදින්නත්, හිමසෙල්ලම් කරන්නත් ඕනේ කියලා හිතනවා.

සත්වෝද්‍යානයටත් ගිහින්, හුරතල් සත්තු ගොඩක් බලන්න ඕනේ.

ඔබ: ආහ්, හොඳයි නේ. හොක්කයිඩෝ යන්නේ පළමු වතාවටද?

යමමොතෝ: ඔව්. පළමු වතාව නිසා ගොඩක්සන්තෝෂයෙන් ඉන්නවා!

**[20-2]**

යමමොතෝ: නටාලි සන් එහෙමත්අලුත් අවුරුදු නිවාඩුවේ කොහෙහරි යනවද?

ඔබ: නැහැ, ගෙදර හෙමින් සීරුවේ ඉන්නවා.

## 21　お持ち帰りですか

**[21-1]**

විකුණුම්කරු: සාදරයෙන් පිළිගන්නවා.

රැගෙන යනවද, නැත්නම් ආපන ශාලාවේදීම අනුභව කරනවාද?

ඔබ: ආ, ආපන ශාලාවේදීමඅනුභව කරනවා.

**[21-2]**

විකුණුම්කරු: ආපන ශාලාවේදීම නේද. ඇණවුම් කිරීමට පෙර,ආසනයක් වෙන්ව තබාගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඔබේ ආසනය වෙන් කිරීමේ තීරණය කරලා තියෙනවද?

ඔබ: තවම නැහැ.

විකුණුම්කරු: එහෙනම් මුලින් ආසනයක් වෙන්කර ගන්න.

ඔබ: තේරුණා.

## 22　おなかいっぱいだから…

**[22-1]**

ඔබ: ආහ්, රසයි නේ!

යූතෝ: ඔව්, ඇත්තටම. ඔක්කොම රසයි.

අතුරුපස කොහොමද?අනුභව කරනවාද?

**[22-2]**

ඔබ: මොකද කරන්නේ... යූතෝ කුන්, ඔයා කනවද?

යූතෝ: ඔව්, කන්න හිතෙනවා. යාමි සන්, ඔයා?

ඔබ: මට දැනටමත් බඩ පිරිලා, ඒ නිසා මට ඕනේ නැහැ.

## 23　大阪ジュースって…？

**[23-1]**

විකුණුම්කරු: සාදරයෙන් පිළිගන්නවා. මෙනුව මෙන්න. ඔබේ ඇණවුම?

ඔබ: අම්… සමාවෙන්න. මේ “ඔසාකා ජූස්” කියන්නේ මොකක්ද?

**[23-2]**

විකුණුම්කරු: මේක ඔසාකාහි ප්‍රසිද්ධ ජූස් එකක්. කිරි, කෙසෙල් සහ මැන්ඩරින් දොඩම් තියෙනවා.

ඔබ: ඇපල් දමා තියෙනවද?

විකුණුම්කරු: නැහැ, ඇපල් දමලා නැහැ.

## 24　予約したいんですが…

**[24-1]**

විකුණුම්කරු: හෙලෝ, මේ හිරෝතා සුෂි වෙයි.

ඔබ: අම්… වෙන් කිරීමක් කරන්න ඕනේ.

විකුණුම්කරු: හරි. කවදාටද වෙන් කිරීම කරන්න ඕනේ?

ඔබ: ලබන සෙනසුරාදා 12ට දෙන්නෙක් සඳහා වෙන් කරගන්න ඕනේ.

විකුණුම්කරු: හරි, පරීක්ෂා කරන්නම්. ටිකක් රැඳී සිටින්න.

…රැඳී සිටියාට ස්තූතියි. බොහොම කණගාටුයි, ඒ වෙලාවට සියලු ආසන පිරී තියෙනවා…

11ට හෝ 13 ට නම් දෙන්නෙක් සඳහා ආසන සූදානම් කරන්න පුළුවන්.

11ට තතමි ආසන සහ කවුන්ටර් ආසන, 13ට කවුන්ටර් ආසන වෙන් කළ හැකියි.

**[24-2]**

ඔබ: එහෙනම් 11ට තතමි ආසනයක් දෙන්න.

විකුණුම්කරු: තේරුණා. එහෙනම් ඔබේ නම සහ දුරකථන අංකය කියන්න.

ඔබ: මම නිකෝල්. දුරකථන අංකය 090-123-4567.

විකුණුම්කරු: හරි. වෙන් කිරීම කරලා ඉවරයි.

අවලංගු කරනවා නම්, වෙන් කළ දිනට පෙර දින වන විට දුරකථනයෙන් දන්වන්න.

## 25　スープは、どう？

**[25-1]**

ඔබ: මේ සුෂි හරිම රසයි!

හිනා චන්, ඔයා සුෂි කැමතියි නේද? කාලා බලන්න!

හිනා: වාව්, රසවත් වගේ! පස්සේ කාලා බලන්නම්.

ආ, මේ සලාදයත් රසයි. ඩ්‍රෙසින් එක ටිකක් ඇඹුල්.

ඔබ: ආහ්, ටිකක් කාලා බලමු... ආ, ඇත්තටම. රසයි!

අර සුප් එක කොහොමද?

හිනා: හ්ම්... ලුණු ටිකක් වැඩියි, මට නම් ටිකක්...

ඔබ: ආ, එහෙමද. රසවත් වගේ පේනවා, ඒත්...

**[25-2]**

ඔබ: අරේ? හිනා චන්, ඔයා දැනටමත් අතුරුපස කනවද?

හිනා: ඔව්. මේ බිස්කෙට් වලට ගොඩක් පැණි නැහැ, ටිකක් තිත්තයි, වැඩිහිටි රසක් තියෙනවා, රසයි.

## 26　右にまっすぐ行ってください

**[26-1]**

ඔබ: අම්... මට ටෝකියෝ නාගරිකකලා කෞතුකාගාරයට යන්න ඕනේ.

දුම්රිය සේවකයා: ටෝකියෝ නාගරිකකලා කෞතුකාගාරය නේද.

කෞතුකාගාරය 4 වන පිටවීම නිසා ප්‍රවේශ පත්‍ර ගේට්ටුවෙන් එළියට ගිහින්, දකුණට කෙලින්මයන්න.

ඔබ: දකුණට කෙලින්මනේද.

දුම්රිය සේවකයා: ඔව්, ඊට පස්සේ ඉදිරියෙන් මාර්ගය අවසන් වන තැන දකුණට හැරෙන්න.

එහෙමම ඉදිරියට ගියාම, විදුලි සෝපානයක් තියෙනවා.

විදුලි සෝපානයෙන් උඩට ගියාම 4 වන පිටවීම.

**[26-2]**

දුම්රිය සේවකයා: පිටවුමින් එළියට ගියාම, ඉදිරියෙන් ලොකු පදික මාරුවක් තියෙනවා, ඒක හරහා යන්න.

ඔබ: පදික මාරුව හරහා යන්න නේද.

දුම්රිය සේවකයා: ඔව්. හරහා ගිහින් වමට කෙලින්මඇවිදින්න.

දෙවැනි කෙළවරින්දකුණට හැරිලා ටිකක් ගියාම, දකුණු පැත්තේ කෞතුකාගාරය තියෙනවා.

## 27　まもなく黒川です

**[27-1]**

නිවේදනය: මේ දුම්රිය, නිෂිහරා (නිෂිහරා)බලා යන සීඝ්‍රගාමී දුම්රියයි.

තව මොහොතකින්කුරොකාවා (කුරොකාවා) වේ. පිටවීම වම් පැත්තෙනි.

**[27-2]**

නිවේදනය: තව මොහොතකින්කුරොකාවා, කුරොකාවා. පිටවීම වම් පැත්තෙනි.

උමං දුම්රිය මාර්ගයට සහ මොනොරේල් මාර්ගයට මෙහිදී මාරු වන්න.

කුරොකාවාට පසුඅවසාන නැවතුම වන අඹබාහි (අඹබා) නවත්වනවා.

තකදා (තකදා)සහ ශිරයිෂිහි (ශිරයිෂී) නවත්වන්නේ නැති නිසා, සැළකිලිමත් වන්න.

## 28　コンビニの前にいるよ

**[28-1]**

ඔබ: ආ, හෙලෝ. යුයි චන්? දැන් කොහෙද?

යුයි: ආ, මම දැනටමත් ආවා. කන්වීනියන්ස් වෙළඳ සැලඉස්සරහ ඉන්නවා.

ඔබ: ඇත්තටම? මමත් කන්වීනියන්ස් වෙළඳ සැලඉස්සරහ ඉන්නේ...

යුයි: ඇත්තටම? අම්...දුම්රිය ස්ථානයඇතුළෙත් කඩයක් තියෙනවා, ඒක නෙවෙයි, දුම්රිය ස්ථානයේපිටත තියෙන කන්වීනියන්ස් වෙළඳ සැල නේද?

ඔබ: ඔව්. ආසන්නයේපොත් කඩයක්,තියෙනවා නේද.

යුයි: හ්ම්? පොත් කඩයක්? පොත් කඩයක් නැහැනේ. බැංකුවක් නම් තියෙනවා.

**[28-2]**

ඔබ: බැංකුවක්... ආ, තේරුණා! ඒ උතුරු පිටවුමේ කන්වීනියන්ස්වෙළඳ සැල.

යුයි චන්, අපි හමුවෙන්න තියෙන්නේ මෙහෙ. දකුණු පිටවීමේ කන්වීනියන්ස්වෙළඳ සැල.

මිතුරිය: අයියෝ, සමාවෙන්න! දැන්ම එන්නම්! රැඳී ඉන්න!

## 29　電車がぜんぶ止まっているそうです

**[29-1]**

නිවේදනය: මේ මොහොතේ සිට,ඉදිරියෙන් යන දුම්රිය, රථ පරීක්ෂාවක් නිසා, සියළුමදුම්රිය ධාවනය තාවකාලිකව නවතා ඇත. ධාවනය නැවත ආරම්භ කරන වේලාව තවම තීරණය වී නැත.

ඔබ: අම්... සමාවෙන්න. දැන්,මොනවද කිව්වේ? හොඳට ඇහුනේ නැහැ...

අසල සිටින කෙනා: ආ, නිවේදනයද?

ඉදිරියේ දුම්රියක මොනවහරි වෙලා, දුම්රිය ඔක්කොම නවත්තලා තියෙනවා කියනවා.

ඔබ: ඒ, ඇත්තද? එහෙනම්, කොයි වේලාවේද යළි ධාවනය වන්නේ?

අසල සිටින කෙනා: තවම දන්නේ නැහැ කියනවා.

ඔබ: එහෙමද.

**[29-2]**

නිවේදනය: මාර්ග සංඥාව කොළ පාට වුණාම ධාවනය නැවත ආරම්භ කරනවා.

අද, මේ දුම්රිය, ඊළඟ දුම්රිය ස්ථානයේදීධාවනය අවසන් කරනවා.

මොරිකාවා දුම්රිය ස්ථානය දිශාවට ඉක්මනින් යාමට සිටිනඅය, ඊළඟ දුම්රිය ස්ථානයේදී නන්බොකු උමං දුම්රිය මාර්ගයට මාරු වන්න.

ඔබ: අම්, සමාවෙන්න. දැන් කිව්වේ මොකක්ද?

අසල සිටින කෙනා: ආ, මේ දුම්රිය, යන්නේ ඊළඟ දුම්රිය ස්ථානයදක්වා විතරයි කියනවා.

ඒ නිසා මොරිකාවා දුම්රිය ස්ථානයට යනවා නම්, ඊළඟ දුම්රිය ස්ථානයෙන් බැහැලා නන්බොකු උමං දුම්රියමාර්ගයට මාරු වුණාම තමයි හොඳ.

ඔබ: එහෙමද. ස්තුතියි.

## 30　お客さん、どちらまで？

**[30-1]**

රියදුරු: මගී ඔබ, කොහෙටද යන්න ඕනේ?

ඔබ: දුම්රිය ස්ථානය දක්වා යෑම පිණිස.

**[30-2]**

රියදුරු: තව මොහොතකින්දුම්රිය ස්ථානය ළඟයිනේ. වාහන ගොඩක් තියෙනවා නේ. කොහෙද නවත්වන්න?

ඔබ: ආ, ඇත්තටම. බස් නැවතුම ඉස්සරහත් කමක් නැහැ.

රියදුරු: සමාවෙන්න, බස් නැවතුම ඉස්සරහ නවත්වන්න බැහැ.

ඔබ: ආ, එහෙමද. එහෙනම් අර කොණේ.

රියදුරු: එතැනත් බැහැ වගේ. අර මල් කඩය ඉස්සරහ නම් හොඳයිද? එතැන නම් නවත්වන්න පුළුවන්.

ඔබ: එහෙනම්, එතැන.

## 31　ちょっと忙しいけど、元気だよ

**[31-1]**

ඔබ: මාරියා සන්, ගොඩක් කාලෙකින්!

මාරියා: ආ, අනස් සන්! ඇත්තටම ගොඩක් කාලෙකින්. සනීපෙන්ද?

ඔබ: ඔව්, ස්තූති වන්ත වෙන්න සනීපෙන්.

**[31-2]**

ඔබ: මාරියා සන්, ඔයා සනීපෙන් හිටියාද?

මාරියා: ඔව්. ටිකක් කාර්යබහුලයි, ඒත් ඉතින් සනීපෙන්.

ඔබ: එහෙමද. කාර්යබහුලද?

මාරියා: ඔව්. මම හෝටලේ පිළිගැණුම් කවුන්ටරයේ වැඩ කරනවා, ගිම්හාන නිවාඩුව නිසා අමුත්තන් ගොඩක්...

හැමදාම හරිම කාර්ය බහුලයි.

ඔබ: ආ, ඒක නම් ඉතාමත් අපහසුයි නේ.

මාරියා: ඔව්, නමුත්, විවිධ රටවල අමුත්තන් එක්ක කතා කරන්න පුළුවන් නිසා, සතුටුයි.

ජපන් සහ ඉංග්‍රීසි දෙකම භාවිත කරන නිසා, ඉගෙන ගැනීමක් වෙනවා.

ඔබ: හොඳයි. ඒ වැඩේ මරියා සන්ටහරියටම ගැළපෙනවා.

## 32　週末何してるの？

**[32-1]**

මිතුරිය: සති අන්තයේ, ටෙනිස් ගැහුවා. ඒ නිසා, උරහිස ටිකක් රිදෙනවා...

ඔබ: එහෙමද. නිතර ටෙනිස් ගහනවද?

මිතුරිය: නැහැ, මම ක්‍රීඩා වලට වැඩිය කැමති නැහැ... ඒත් යාළුවෝ එක්ක.

ඔබ: එහෙමද. සාමාන්‍යයෙන් සති අන්තයේ, මොනවද කරන්නේ?

මිතුරිය: ආ, මගේ විනෝදාංශය උයන එක. හැම වෙලේම විවිධ රටවල කෑම හදනවා.

ඒ වගේම, චිත්‍රපටත් නිතර බලනවා.

ඔබ: ආහ්, මමත් චිත්‍රපට වලට, කැමතියි.

**[32-2]**

ඔබ: මොන වගේ චිත්‍රපට වලටද කැමති?

මිතුරිය: විද්‍යා ප්‍රබන්ධ, ප්‍රහසනවගේ ඕනෑම දෙයක් කැමතියි.

ආ, ඒත්, භයානක චිත්‍රපට නම් කිසිම වෙලාවක බලන්නේ නැහැ, බය දේවල් මට අපහසුයි...

ඔබ: ආ, එහෙමද. මම සටන්චිත්‍රපට වලට කැමතියි.

මිතුරිය: ඇත්තටම! මමත්, සටන්චිත්‍රපට වලට, ගොඩක් කැමතියි!

## 33　どのぐらい日本語を勉強していますか

**[33-1]**

ඔබ: හමු වීම සතුටක්. මම වෙන්. ආර්ථික විද්‍යා පීඨයේ තුන්වන වසරේ ශිෂ්‍යයෙක්.

ආර්ඩන්: ආ, සියළුම දෙනා දැක හමු වීම සතුටක්. මම ආර්ඩන්. ගිය අවුරුද්දේ ඇමරිකාවේ සිට පැමිණියා.

මම විශ්වවිද්‍යාලයේ හතරවන වසරේ.

ඔබ: ආර්ඩන් සන්, ඔබේ ජපන් භාෂාව ඉතාමත් විශිෂ්ඨයි නේ!

කොච්චර කාලයක් ජපන් භාෂාව ඉගෙනගෙන තියෙනවද?

ආර්ඩන්: බලමු… කනිෂ්ඨ උසස් පාසල් ශිෂ්‍ය කාලයේ සිට නිසා… දැන් අවුරුදු 8ක් විතර.

**[33-2]**

ඔබ: ජපන් භාෂාව ඉගෙනගන්න හිතුවේ ඇයි?

ආර්ඩන්: මුලින්ම හේතුව ඇනිමේ.

කනිෂ්ඨ උසස් පාසල් ශිෂ්‍ය කාලයේ පළමු වතාවට බලලා, ජපන් භාෂාව ඉගෙනගෙන බලන්න ඕනේ කියලා හිතුණා.

ඔබ: එහෙමද. ආරම්භක හේතුව ඇනිමේ නේද.

ආර්ඩන්: ඔව්. ඒත් දැන් උපාධි පාසලේ ජපන් සාහිත්‍යය පර්යේෂණ කරන්න ඕනේ නිසා, හැමදාම පොත් ගොඩක් කියවනවා.

ඔබ: සාහිත්‍ය පර්යේෂණයක්ද! අමාරු වගේ… ඒත්, රසවත් වගේ.

## 34　休みはどこか行きましたか

**[34-1]**

ඔබ: නකමුරා සන්, නිවාඩුවේ කොහෙහරි ගියාද?

නකමුරා: ඔව්. පවුලත් එක්ක මුහුදට ගියා. සෙනසුරාදා කාලගුණය හරිම හොඳ වුනානේ.

ඔබ: හොඳයි නේ. මුහුදේ නෑවාද?

තනාකා: ඒක තමයි, වතුර තවම හරිම සීතල නිසා, නෑවේ නැහැ.

ඒත් මුහුද බලමින් පළඟා කෑම් කළා.

පළඟා කෑම් වලදී මාළු පිළිස්සීම කළේ පළමු වතාවට, ඒත් හරිම රසයි.

ඔබ: එහෙමද.

**[34-2]**

ඔබ: පළඟා කෑම් වලින් පස්සේ මොකද කළේ?

නකමුරා: සෙනසුරාදා මුහුද ළඟ නතර වෙලා, ඉරිදා සාප්පු සංකීර්ණ යට ගියා.

ඔබ: ආහ්. මොනවහරි ගත්තාද?

නකමුරා: මට සපත්තු ගන්න ඕනේ වුණා, ඒත් හොඳ ඒවා තිබුණේ නැහැ...

ඒ නිසා කිසි දෙයක් ගන්නේ නැතුව, චිත්‍රපටයක් බලලා ගෙදර ආවා.

ළමයි “මම කැමති මංගා එක චිත්‍රපටයක් වෙලා, ඒක බලන්න ඕනේ” කියලා කිව්වා...

මම නොදන්න මංගා එකක් වුනත්, ඒත් චිත්‍රපටය රසවත් වුණා.

ඔබ: හොඳයි නේ.

## 35　おすすめの場所はありますか

**[35-1]**

ඔබ: අම්... කොබයාෂි, මේ සැරේ ගමනකට අකානේ නගරයට යන්න වෙලා තියෙනවා.

කොබයාෂි: ආ, එහෙමද!

ඔබ: කොබයාෂි අකානේ නගරයෙන් නේද? නිර්දේශ කරන්න තැනක් තියෙනවද?

කොබයාෂි: බලමු. දුම්රිය ස්ථානයේ සිට ටිකක් දුරයි, ඒත් කඳු පැත්තේ ප්‍රසිද්ධ මාලිගාවක් තියෙනවා...

මේ කාලෙට, සකුරා මල් හරිම ලස්සනයි.

මාලිගාව ඉස්සරහ චතුරශ්‍රයේමල් නැරඹීමට එන අය ගොඩක්, ඉතා සජීවීයි.

ඔබ: හොඳයි නේ.

**[35-2]**

ඔබ: යම් අයුරක, ආහාර ගැන නිර්දේශයක් තියෙනවද?

කොබයාෂි: එහෙමනම්. අකානේ (අකානේ) නගරය රාමෙන් සඳහා ප්‍රසිද්ධයි, ඒ වාගේම මාළුත් රසයි.

ඔබ: එහෙමද.

කොබයාෂි: සුෂිත් හොඳයි, ඒත් ප්‍රදේශීය මාළු භාවිත කරන ඉතාලි අවන්හලක් තමයි මගේ හොඳම නිර්දේශය.

ඔබ: ඉතාලි අවන්හලක්ද. අනිවාර්යයෙන් යන්න ඕනේ.

## 36 ご利用は初めてですか

**[36-1]**

කාර්ය මණ්ඩලය: ආයුබෝවන්. පුහුණු කාමරය භාවිත කරන්නේ පළමු වතාවටද?

ඔබ: ඔව්, පළමු වතාවට.

කාර්ය මණ්ඩලය: එහෙනම්, භාවිත කරන ආකාරය පැහැදිලි කරන්නම්.

මුලින්ම, සපත්තු ගැන. පුහුණු කාමරයේ අනිවාර්යයෙන්ම ගෘහස්ථ සපත්තු පළඳින්න.

පිටත පළඳින සපත්තු භාවිත කරන්න බැහැ.

ඔබ: තේරුණා.

කාර්ය මණ්ඩලය: ඒ වගේම, වතුර හෝ ක්‍රීඩා පානය වගේ දේවල් ගෙන යන්න පුළුවන්, ඒත් ඒවා පෙට් බෝතලයක් වගේ පියනක් තියෙන බෝතලයක දාගෙන එන්න.

කෑන් හෝ කප් ඇතුළට ගෙන යන්න බැහැ.

**[36-2]**

කාර්ය මණ්ඩලය: ඊළඟට... යන්ත්‍ර භාවිත කරන ආකාරය.

යන්ත්‍රයක් භාවිත කරලා ඉවරවුණාම, ඊළඟට භාවිත කරන කෙනා වෙනුවෙන් තුවායෙන් දහඩිය පිස දමන්න.

ඔබ: තේරුණා. අර තුවා නේද.

කාර්ය මණ්ඩලය: ඔව්. භාවිත කළ තුවා, අර පෙට්ටියට දාන්න.

ඒ වගේම එක යන්ත්‍රයක් භාවිත කළ හැකි කාලය, මිනිත්තු 15දක්වා.

ඔබ: මිනිත්තු 15ක්ද?

කාර්ය මණ්ඩලය: ඔව්. පුහුණුව ඉවර වුණාම එතැනින් ඉවත් වෙන්න.

වෙන කෙනෙක් රැඳී සිටීමට පුළුවන් නිසා.

යන්ත්‍රය මත ඉඳගෙන විවේක නොගන්න ලෙසට ඉල්ලා සිටිනවා.

## 37　どんなイベント？

**[37-1]**

මිතුරා: අහන්නකෝ, ලබන සතියේ මගේ සම්මන්ත්‍රණ කණ්ඩායම උත්සවයක් සැලසුම් කරනවා.

ඔබ: වාව්, නියමයි! මොන වගේ ඉඋත්සවයක්ද?

මිතුරා: ජාත්‍යන්තර සහයෝගිතා උත්සවයක්.

ජපන් ශිෂ්‍යයෝ සහ විදේශ ශිෂ්‍යයෝ එකට ගේම් ක්‍රීඩා කරමින්, කතාබහ කිරීම් යනාදිය.

යාළුවෝ ගොඩක් හදාගන්න පුළුවන්.

ඔබ: ආහ්, කොහෙද කරන්නේ?

මිතුරා: A201 පන්ති කාමරයේ!

**[37-2]**

ඔබ: ඒ උත්සවය නම් විනෝදයි වගේ! කවදාද?

මිතුරා: ලබන අඟහරුවාදා 6ට තමයි.

ඔබ: ලබන අඟහරුවාදාද… ආ! මට යන්න පුළුවන්!

මිතුරා: ආ, නියමයි! එහෙනම්, තීරණයයි!

ඔබ: ඔව්. අයදුම් කරන විදිහ කියන්න.

මිතුරා: දුරකථනයෙන් හෝ ඊමේල් එකෙන් කරන්නත් පුළුවන්, ඒත් මේ විදිහ ලේසි වගේ.

මේ QR කේතය ස්කෑන් කරන්න.

## 38　お時間はどうされますか

**[38-1]**

විකුණුම් සේවක: සාදරයෙන් පිළිගන්නවා.දෙන්නෙක් සඳහාද?

ඔබ: ඔව්, එහෙමයි.

විකුණුම් සේවක: කාලය කොච්චරකටද?

ඔබ: පැය දෙකකට, දෙන්න.

විකුණුම් සේවක: සාමාජික කාඩ්පතක් හෝ ශිෂ්‍ය හැඳුනුම්පතක් තියෙනවද?

ඔබ: ආ, ඔව්, තියෙනවා.

**[38-2]**

විකුණුම් සේවක: එහෙනම් ඔබේ කාමරය 5 වන මහලේ 503.

මෘදු පානයන් කැමති අයුරින් බොන්න පුළුවන්, ඒ නිසා පාන බාරයෙන් කැමති විදිහට ගන්න.

සුවපහසුවෙන් විනෝද වෙන්න.

## 39　遅れないようお願いします

**[39-1]**

මාර්ගෝපදේශකයා: ඔන්න, හැමෝම, අපි “කෙන්චෝජි” විහාරපිවිසුමට ආවා.

මේ “කෙන්චෝජි” 1253දී ඉදිකරපු ඉතිහාසයක් ඇති විහාරයක්.

ඒ වගේම කමකුරාහි ලොකුම විහාරය, ඇතුළේ බලන්න තැන් ගොඩක් තියෙනවා.

අවන්හලට යන තෙක්, ඔබට නිදහස් කාලය.

විහාරය ඇතුළේ කැමති තැන්, මෙතැන් සිටපැයක් පුරා නිදහසේ නැරඹීමේ සිදු කරන්න.

**[39-2]**

මාර්ගෝපදේශකයා: විහාරය නැරඹීම ඉවරවුණාට පස්සේ 11:30ට ඊළඟ තැන වන දිවා ආහාර අවන්හලට යනවා.

මිනිත්තු 5කට කලින්, 11:25ට එකතු වෙන්න.

එකතු වෙන තැන වාහන නැවැත්වීමේ ස්ථානය, අම්... අපි ටිකකට කලින් බස් එකෙන් බැස්ස තැන.

හැමෝම එකතු වුණාට පස්සේ අවන්හලට යන නිසා, පරක්කු නොවන ලෙසට ඉල්ලා සිටිනවා

## 40　SNSにアップしても大丈夫です

**[40-1]**

කාර්ය මණ්ඩලය: අද කර්මාන්තශාලා නැරඹීමේ සංචාරයට පැමිණි ඔබ සැමට බොහොම ස්තුතියි.

මුලින්ම, ඡායාරූප ගැනීම ගැන ඉල්ලීම් කිහිපයක් තියෙනවා.

කර්මාන්තශාලාව ඇතුළේ නිදහසේ ඡායාරූප ගන්න පුළුවන්, ඒත් ෆ්ලෑෂ් භාවිත නොකරන්න.

ඒ වගේම, ස්මාර්ට්ෆෝන් හෝ කැමරාව අනිවාර්යයෙන් අතේ තියාගෙන ඡායාරූප ගන්න.

ට්‍රයිපොඩ් හෝ සෙල්ෆි ස්ටික් භාවිත කිරීම අනතුරුදායක නිසා භාවිත කිරීමෙන් වළකින්න.

**[40-2]**

කාර්ය මණ්ඩලය: අම්... ඊළඟට, SNS වෙත උඩුගත කිරීම ගැන පැහැදිලි කරන්නම්.

අද ගත්ත ඡායාරූප, SNS එකට දාන්න පුළුවන්.

ඒත්, වෙනත් අමුත්තන් හෝ කාර්ය මණ්ඩලය පෙනෙන ඡායාරූප උඩුගත කරන්න එපා.

රසකැවිලි හෝ යන්ත්‍ර පමණක් තියෙන ඡායාරූප නම් ප්‍රශ්නයක් නැහැ.

නීති පිළිපදිමින් නැරඹීමේ සංචාරය සන්තෝෂයෙන් විඳින්න.

## 41 初めてなんですが…

**[41-1]**

පිළිගැනීමේ නිලධාරි: ආයුබෝවන්.

ඔබ: අම්… මම පළමු වතාවටයි එන්නේ…

පිළිගැනීමේ නිලධාරි: ආ, හරි. වෙන් කිරීමක් කරලා තියෙනවද?

ඔබ: ඔව්. අන්තර්ජාලයෙන් 11ට වෙන් කළා.

පිළිගැනීමේ නිලධාරි: 11ට වෙන් කරපු කන් සන් නේද. එහෙනම් මයි නම්බර් කාඩ්පත දෙන්න.

**[41-2]**

පිළිගැනීමේ නිලධාරි: එහෙනම් මේ ප්‍රශ්නාවලි පත්‍රයේ ඔබේ ලිපිනය, නම, අද තියෙන රෝග ලක්ෂණ වගේ දේවල් ලියන්න.

අර සෝෆාවේ වාඩි වෙන්න.

ඔබ: හරි.

## 42　しばらく家で休んでください

**[42-1]**

වෛද්‍ය ගාර්සියා, සන් තුවාල වුණු තැන හැකි තරම් නොසෙලවීම් නොකොට, ටික දවසක් ගෙදර විවේක ගන්න.

ඔබ: තේරුණා. අම්... නාන්න පුළුවන්ද?

වෛද්‍ය: අද නාන්න එපා. ශරීරය පිස දාගන්න විතරක්. කරන්න.

ඔබ: තේරුණා. ස්තුතියි.

**[42-2]**

ඔබ: අම්... අනිද්දා පාපන්දු පුහුණුවක් තියෙනවා... එය කලාට කමක් නැද්ද?

වෛද්‍ය: අනිද්දාද? අනිද්දා නම්, අමාරුයිනේ.

ඔබ: එහෙමද. අම්... කවදා ඉදන් පුහුණු වෙන්න පුළුවන්ද?

වෛද්‍ය: බලමු. ඉක්මනින් නම් අමාරුයි කියලා හිතනවා.

ටික දවසක් පුහුණු වෙන්න එපා.

ඊට පස්සේ සතියකින් ආයෙත් පෙන්වන්න. එතකොට තීරණය කරමු.

ඔබ: හරි, තේරුණා.

## 43　あまり飲まないようにしています

**[43-1]**

ඔබ: ඉෂිකාවා සන්, බීම වර්ග, මොනවද ගන්නේ?

ඉෂිකාවා: අම්... එහෙනම් උලොන් තේ එකක් දෙන්න.

ඔබ: අරේ, මත්පැන් බොන්නේ නැද්ද?

ඉෂිකාවා: මම මත්පැන් ගොඩක් කැමතියි, ඒත් වෛද්‍යවරයා වැඩිය බොන එක හොඳ නැහැ කිව්වා...

ඒ නිසා මේ දවස්වල වැඩිය බොන්නේ නැතිව ඉන්න උත්සාහ කරනවා.

ඔබ: ආ, එහෙමද. එහෙනම්, එහෙම, පරිස්සම් වුණාම හොඳයි.

**[43-2]**

ඉෂිකාවා: තවත් දේවල් ගොඩක් ගැනත් පරිස්සම් වෙනවා.

ඔබ: ආහ්, මොන වගේ දේවල්ද?

ඉෂිකාවා: අම්... මම ලුණු වැඩි කෑම කැමතියි, ඒත් වැඩිය නොකන්න උත්සාහ කරනවා.

දවල් කෑම හැමදාම කන්වීනියන්ස් වෙළ ද සැලෙන්ගන්නවා, ඒත් ලුණු අඩු දේවල් තෝරනවා.

ඔබ: ආ, ඒක, වැදගත් නේ.

ඉෂිකාවා: ඒ වගේම ව්‍යායාම කරනවා.

හැම උදෑසනම සමාගමට දුම්රිය ස්ථාන එකකට කලින් දුම්රියෙන් බැහැලා මිනිත්තු 20ක් විතර ඇවිදිනවා.

තව, ජොගින් පටන් ගත්තා. වැඩ ඉවර වෙලා පැයක් විතර දුවනවා.

ඔබ: හොඳයි. මමත් කරලා බලන්නද කියලා හිතෙනවා.

## 44　どうぞお大事になさってください

**[44-1]**

ඖෂධශාලාවේ කෙනා: රැඳී සිටියාට ස්තුතියි. අද අසාත්මිකතා ඖෂධ නිකුත් කරලා තියෙනවා.

මුලින්ම,මේවා අක්ෂි බිංදු. ඇස් කැසීම අඩු කරනවා.

ඔබ: හරි.

ඖෂධශාලාවේ කෙනා: මේක දවසට දෙවරක්, උදේ සහ රෑ භාවිත කරන්න.

**[44-2]**

ඖෂධශාලාවේ කෙනා: ඊළඟට මේක බොන බෙහෙතක්. කිවිසුම් සහ නාසයෙන් දියර ගැලීම නවත්වන බෙහෙතක්.

දවසට එකවරක් උදේ කෑමෙන් පස්සේ බොන්න. සතියකට ඇති තරම්.

ඔබ: හරි, තේරුණා.

ඖෂධශාලාවේ කෙනා: මේ බෙහෙතෙන් ටිකක් නිදිමත එන්න පුළුවන්, ඒ නිසා අවධානයෙන් ඉන්න.

ඔබ: හරි.

ඖෂධශාලාවේ කෙනා: එහෙනම් ඉක්මනින් සුව වෙන්න.

ඔබ: ස්තුතියි.

## 45　お名前をお願いします

**[45-1]**

හෙදිය: ඔබේ නම කියන්න.

ඔබ: ලී ෂුන්.

හෙදිය: එහෙනම් එක් අතක් මෙතැන තියාගෙන, අතේ ඇඟිලි ටිකක් මෘදුව මිට මොලවා ගන්න.

**[45-2]**

හෙදිය: මධ්‍යසාර වලින් විෂබීජ නාශනය කළාම සම රතු වෙලා තියෙනවද කලින්?

ඔබ: නැහැ.

හෙදිය: තේරුණා. අපහසුවක් වගේ දැනුණොත් වහාම කියන්න.

...හරි, ඉවරයි දැන්. මහන්සි වුණාට ස්තුතියි.

මෙතැන මිනිත්තු 5ක් විතර ඇඟිල්ලෙන් තද කරගෙන ඉන්න. සම්බාහනය නොකරන්න හොඳයි.

ඔබ: තේරුණා. ස්තුතියි.

## 46　お給料について説明します

**[46-1]**

කළමනාකරු: එහෙනම් වැටුප ගැන පැහැදිලි කරන්නම්. මූලික පැයක වැටුප යෙන් 1,300යි.

සවස 5ට පස්සේ යෙන් 100ක් වැඩි වෙනවා.

ඔබ: හරි, තේරුණා.

කළමනාකරු: ඒ වගේම සෙනසුරාදා සහ ඉරිදා සතියේ දිනවලට තවත් යෙන් 50ක් වැඩි වන අතර, මූලිකව යෙන් 1,350යි.

ඔබ: තේරුණා. ස්තුතියි.

**[46-2]**

ඔබ: සමාවෙන්න, ප්‍රශ්නයක් තියෙනවා.

කළමනාකරු: අහන්න.

ඔබ: ඇඳුම් ගැන නියාමනයක් තියෙනවද?

කළමනාකරු: ආ, ඔව්. වෙළඳ සැලේදී, නිළ ඇඳුම් එප්‍රණය හඳිනු ලබනවා.

ඒකට යටින් අඳින ඇඳුම් ඔබම සූදානම් කරගන්න.

උඩට සුදු ෂර්ට් එකක් අඳින්න. යටට කළු කලිසමක් අඳින්න. ස්කර්ට් බැහැ.

ඔබ: තේරුණා. ස්තුතියි.

## 47　来てもらえると助かるんだけど

**[47-1]**

කළමනාකරු: සූ සන්, ටිකක් කතා කරන්න පුළුවන්ද?

ඔබ: ඔව්, කළමනාකරු, මොකක්ද?

කළමනාකරු: ලබන බදාදා ගැන. යමශිතා සන්හදිසියේ නිවාඩු ගන්න වෙලා...

කණගාටුයි, කියන්න, යමශිතා සන් වෙනුවට සේවා මුරයට එන්න පුළුවන්ද?

ඔබ: තේරුණා. පුළුවන්.

කළමනාකරු: ස්තුතියි. ලොකු උදව්වක්.

**[47-2]**

කළමනාකරු: තව මේ මාසේ අන්තිම සෙනසුරාදා, 29 වෙනිදා, බොහොම කාර්යබහුල වෙයි වගේ.

පැය 2ක් 3ක් විතරක් හරි එන්න පුළුවන් නම් ලොකු උදව්වක්...

ඔබ: සමාවෙන්න. එදා නම් ටිකක් අමාරුයි...

## 48　野菜を切ってもらえる？

**[48-1]**

කළමනාකරු: ආ, රියු සන්, සුබ උදෑසනක්! අද මුලින්ම පිරිසිදු කිරීම කරන්න පුළුවන්ද?

වාතය හොඳ නැති නිසා මුලින්ම ජනෙල් ඔක්කොම අරින්න පුළුවන්ද?

ඔබ: හරි, තේරුණා.

කළමනාකරු: ඊට පස්සේ හැමදාම වගේ ශාලා බිම වැකුම් කරන්න.

මේස මම දැනටමත් පිසලා ඉවරයි, ඒක ගැන කමක් නැහැ!

ඔබ: හරි, තේරුණා.

කළමනාකරු: වැසිකිළි පිරිසිදු කිරීමත් මම කරලා තියන්නම්. එහෙනම්, එසේ කරන්න!

**[48-2]**

කළමනාකරු: රියු සන්, ඊළඟට එළවළු සූදානම් කරමු. මෙතැන තියෙන එළවළු කපන්න පුළුවන්ද?

ඔබ: හරි. තේරුණා.

කළමනාකරු: ගෝවා,සිහින්ව කපන්න.

ඔබ: හරි, සිහින්ව නේද. තේරුණා. කැරට්ත් කපන්නද?

කළමනාකරු: ඔව්, කැරට් වටවට කපන්න.

ඔබ: වටවට…?

කළමනාකරු: ආ, වටවට කපනවා කියන්නේ රවුම් හැඩයට. කපපු පැත්ත රවුම් වෙන්න කපන්න.

ඔබ: ආ, හරි. තේරුණා.

## 49　何かいい方法がありますか

**[49-1]**

ඔබ: ඉතෝ, සන් මට කෑමවල නම් මතක තියාගන්න අමාරුයි. හොඳ ක්‍රමයක් තියෙනවද?

ඉතෝ: මටත් මුලදී අමාරුයි. මම ස්මාර්ට්ෆෝන් එකෙන් කෑමවල ෆොටෝ ගෙන, ගෙදරදී නැවත නැවත බැලුවා.

ඔබ: ෆොටෝද! ඒක හොඳයි.

ඉතෝ: තව, අර්ධකාලීන වැඩ කරන අතර කෑමවල නම් නැවත නැවත තහවුරු කරගන්න පුරුදු වුණා.

ඔබ: හොඳයි සන්. හෙට ඉඳන් කරලා බලන්නම්!

**[49-2]**

ඔබ: ඉතෝ සන්, තව එකක් අහන්න පුළුවන්ද?

ඉතෝ: ඔව්, මොකක්ද?

ඔබ: ටිකකට කලින් අමුත්තෙක් “කෑම පරක්කුයි!” කියලා කෝප වුණා…

ඉතෝ: ආ, ඒක අමාරුයි නේ.

ඔබ: ඔව්. හදිසියේ කිව්ව නිසා… හේතුව පැහැදිලි කරන්න බැරි වුණා.

伊藤　：びっくりしますよね。

ඉතෝ: පුදුම වෙනවා නේ.

でも、そういうときは、理由を説明する前に、まず「お待たせして申し訳ありませんでした」と謝るのがいちばんですよ。

ඒත් ඒ වගේ වෙලාවක, හේතුව කියන්න කලින් මුලින්ම “ඔබව රැඳී සිටවීම ගැන සමාවෙන්න” කියලා සමාව ඉල්ලන එක හොඳම දේ.

あなた：そうなんですね。

ඔබ: එහෙමද.

伊藤　：ええ。そのあとで、すぐに店長に報告してください。

ඉනෝ: ඔව්. ඊට පස්සේ වහාම කළමනාකරුට දන්වන්න.

## 50　席を外しております

**[50-1]**

ඔබ: හෙලෝ, මිදෝරි ෂෝජි විකුණුම් අංශයේ පාක් කතා කරනවා.

කිමුරා: හැමදාම ඔබේ සහයෝගයට ස්තුතියි. මම සෙන්ට්‍රල් සිස්ටම්ස් හි කිමුරා.

යමදා අංශ ප්‍රධානියා ඉන්නවද?

ඔබ: සමාවෙන්න. යමදා දැන් තමන්ගේ අසුනේ නැහැ.

කිමුරා: එහෙමද. පසුගිය දවසේ එවපු ලේඛන ගැන කියන්න දෙයක් තියෙනවා...

**[50-2]**

කිමුරා: අම්... යමදා සන් සමඟ ඍජුව කතා කරන්න ඕනේ, ඒ නිසා පස්සේ මමම නැවත කතා කරන්නම්.

ඔබ: හරි, තේරුණා. ස්තුතියි.

## 51　どんなかばんでしょうか

**[51-1]**

සුපිරි වෙළඳ සැල් සේවකයා: දුරකථනය කළාට ස්තුතියි.

මේ වකබා සුපිරි වෙළඳ සැල් සේවා මධ්‍යස්ථානයයි.

ඔබට මොන වගේ උදව්වක් ඕනේද?

ඔබ: අම්... මගේ බෑග් එක අමතක වෙලා තියෙනවා.

**[51-2]**

සුපිරි වෙළඳ සැල් සේවකයා: තේරුණා. මොන වගේ බෑග් එකක්ද?

ඔබ: කළු පාට, ලොකු බැක්පැක් එකක්.

සුපිරි වෙළඳ සැල් සේවකයා: කළු පාට ලොකු බැක්පැක් එකක් නේද.

පිටතින් හඳුනාගන්න ලකුණක් තියෙනවද?

ඔබ: හාවාගේ කී-චේන් එකක් අමුණලා තියෙනවා.

## 52　Wi-Fi がつながらなくて…

**[52-1]**

සහාය: හෙලෝ, මේ සහාය මධ්‍යස්ථානය. මොකද වෙලා තියෙන්නේ?

ඔබ: සමාවෙන්න, Wi-Fi සම්බන්ධ වෙන්නේ නැහැ...

පරිඝනක අන්තර්ජාලය භාවිත කරන්න බැහැ.

සහාය: Wi-Fi නේද. ඔබට අපහසුතාවයක් වුණාට සමාවෙන්න.

එහෙනම් මම කියන විදිහට එක වතාවක් කරලා බලන්න පුළුවන්ද?

あなた　：はい。

ඔබ: හරි.

සහාය: Wi-Fi රවුටරය මොකක්ද කියලා දන්නවද?

රවුටරයේ ජේනුව ගලවලා බලන්න.

ඔබ: තේරුණා.

සහාය: විනාඩියක් විතර ඉඳලා රවුටරයේ ජේනුව ආයෙත් දාන්න.

මේ විදිහට නැවත ආරම්භ කළාම සම්බන්ධ වෙන්න පුළුවන් වෙලාවල් තියෙනවා.

**[52-2]**

ඔබ: හ්ම්... තවමත් සම්බන්ධ වෙන්නේ නැහැ.

සහාය: එහෙමද. එහෙනම් අලුත්වැඩියාව සඳහා අපි එන්නම්.

අම්... හෙට දවල් 2 සිට 4 අතර එන්න පුළුවන්. ඔබට ඒ වෙලාව හරිද?

ඔබ: හරි.

සහාය: එහෙනම් එන්න කලින් අපි ඔබට දුරකථනයෙන් කතා කරනවා.

ඒ වෙලාවේ දුරකථනයට පිළිතුරු දෙන්න පුළුවන් විදිහට ඉන්න පුළුවන්ද?

ඔබ: හරි, තේරුණා. කරුණාකර.

## 53 燃えないごみの日に出すんですよ

**[53-1]**

සතෝ: සුබ උදෑසනක්.

ඔබ: ආ, සතෝ සන්, සුබ උදෑසනක්.

සතෝ: අමිට් සන්, ඒක බඳුනක් නේද.

ඔබ: ආ, ඔව්. පරණ වෙලා නිසා ඉවත දාන්න හිතුවා.

සතෝ: අම්... අද අඟහරුවාදා නිසා දහනය කළ හැකි කසළ දවස නේද.

බඳුන ලෝහ නිසා අද දාන්න බැහැ.

දහනය කළ නොහැකි කසළ දවසට දාන්න ඕනේ.

ඔබ: එහෙමද. මම දැනගෙන හිටියේ නැහැ!

**[53-2]**

සතෝ: දහනය කළ නොහැකි කසළ දෙවැනි සහ හතරවැනි සිකුරාදා.

මේ සතියේ සිකුරාදා හරියටම දෙවැනි සිකුරාදා.

ඔබ: ආ, එහෙමද. තේරුණා!

සතෝ: ආ, තව කසළ දාන වෙලාව ගැනත් අවධානයෙන් ඉන්න.

ඔබ: වෙලාවද?

සතෝ: ඔව්. දහනය කළ හැකි කසළත්, දහනය කළ නොහැකි කසළත්, ප්‍රතිචක්‍රීකරණ කසළත්,

ඔක්කොම උදේ 8ට පෙර දාන්න.

## 54　火事ですか、救急ですか

**[54-1]**

119: මේ 119. ගින්නක්ද, හදිසි අවස්ථාවක්ද?

あなた：救急です。

ඔබ: හදිසි අවස්ථාවක්.

**[54-2]**

119: මොකද වුණේ?

ඔබ: අම්... පාපැදිය පැදගෙන ගිය කෙනෙක් මෝටර් රථයකට හැප්පුණා.

119: තේරුණා. මුලින්ම ස්ථානය කියන්න.

ඔබ: අම්... චූඔ තැපැල් කාර්යාලය ඉස්සරහ පාර.

119: චූඔ තැපැල් කාර්යාලය ඉස්සරහ නේද. තුවාල වුණු කෙනාගේ තත්ත්වය කොහොමද?

ඔබ: ආ... ඔළුව වැදිලා වගේ, රිදෙනවා කියනවා. ලේ එන්නේ නැහැ.

119: තේරුණා. දැන්, ගිළන් රථයඑන ගමන්.

එනකම්, තුවාල වූ කෙනා ළඟ ඉදලා,ඔහුට කතා කරන්න.

තුවාල වූ කෙනාව සොලවන්න එපා.

ඒ වගේම,සයිරන් සද්දය ඇහුණාම අත වනලා සංඥා කරන්න.

ඔබ: හරි, තේරුණා.

## 55　避難してください

**[55-1]**

දැන්,ගින්නක් ඇති වී තිබෙනවා. 4 වන ගොඩනැගිල්ලේ 2 වන මහලේ 213 පරීක්ෂණාගාරයෙන් දුම එනවා. ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සියලු දෙනා නලබල නොවී, ඉක්මනින් ක්‍රීඩා පිටියට ආරක්ෂිත ඉවත් වීම කරන්න.

**[55-2]**

හදිසි පිටවීමෙන් ක්‍රීඩා පිටියට ආරක්ෂිත ඉවත් වීම කරන්න. දුම ආශ්වාස නොවන ලෙස ශරීරය පහත් කරගෙන ඇවිදින්න. ලේන්සුවක් වගේ දෙයකින් කට සහ නාසය වසාගන්න. සෝපානය භාවිත නොකර, පඩිපෙළ භාවිත කරන්න.